## සංක්ෂේපය

මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වූයේ කෘෂිකර්ම හා ගොවිජන සේවා අමාත්‍යාංශය විසින් පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා 2009 වසර තුළ ලබාදුන් මුදල් මඟින් ආරම්භ කළ ස්වයංරැකියා ව්‍යාපෘතීන් හි ලබා ඇති ප්‍රගතිය සොයා බැලීම සහ එම ව්‍යාපෘති සංවර්ධනය සඳහා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීමයි. ඒ අනුව, ක්‍රියාත්මක ස්වයංරැකියාවන් හි ස්වභාවය ක්‍රියාකාරීත්වය මෙන් ම ප්‍රතිලාභීන්ගේ පෙර හා පසු සමාජ-ආර්ථික තත්ත්වයන් අධ්‍යයනයට ලක්විය. මෙම ස්වයංරැකියා ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් තෝරාගත් කණ්ඩායම් තුළ එක් පුද්ගලයෙකුට රු.25,000ක් අදියර දෙකක් යටතේ ලබා දී ඇති අතර ඉන් රු.12,500/-ක් ආපසු අයකර නො ගන්නා අතර ඉතිරි මුදල 5%ක වාර්ෂික පොලියක් සමඟ වාරික 10කින් ගෙවා අවසන් කළයුතු ව තිබේ.

සමස්ත ප්‍රතිලාභීන් 183 දෙනාගෙන් 151 දෙනෙකු එනම් 83%ක සැලකිය යුතු නියැදියක් සමීක්ෂණයට භාජනය කළ අතර ඔවුහු ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 07 තුළ ම ව්‍යාප්තව සිටිය හ. ප්‍රතිලාභීන්ගෙන් 34%ක් සමෘද්ධිලාභීන් වූ අතර මුළු සංඛ්‍යාවෙන් 40%ක් කාන්තාවෝ වූහ. ගෙවිය යුතු ණය වාරික ප්‍රමාණයෙන් 50%කට වඩා ගෙවා අවසන් කළ ප්‍රතිලාභීන්ගේ ප්‍රතිශතය 80%කට ආසන්නව තිබුණි. එසේ ම, ප්‍රතිලාභීන් 69%කගේ ම ප්‍රධාන ආදායම් මාර්ගය ගොවිතැන විය. ආරම්භක ව්‍යාපෘති තුළින් 91%ක් ම ක්‍රියාත්මක තත්ත්වයේ පවතින අතර අතරමග නවතා දමා ඇති ව්‍යාපෘතිවලින් 62%ක් ම මෙම වැඩසටහන යටතේම ආරම්භ කරන ලද නව ව්‍යාපෘති වේ. ප්‍රතිලාභීන්ගෙන් 70%කට පමණ නිෂ්පාදන අලෙවි කිරීමේ දී ගැටළු නො පැවති අතර විශේෂයෙන් සත්ත්ව පාලන ආශ්‍රිත නිෂ්පාදන සඳහා හොඳ වෙළෙඳපොළක් පැවතීම දැකිය හැකි විය.

ව්‍යාපෘතීන් හි පැවති දුර්වලතා ලෙස ලබා දී තිබූ ප්‍රායෝගික පුහුණුව ප්‍රමාණවත් නොවීම, පසු ඇගයීමක් සිදු නො කිරීම සහ ඇතැම් වාණිජ බෝග ව්‍යාපෘති (මුංඇට, බුලත්, අන්නාසි) අසාර්ථක වීම හඳුනාගත හැකිවි ය. ක්‍රියාත්මක ස්වයංරැකියා ව්‍යාපෘති තුළින් කිරි සහ සත්ත්ව ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘති සහ සුරතල් මසුන් ඇති කිරීමේ ව්‍යාපෘති බොහොමයක් අපේක්ෂිත ප්‍රතිඵල ලබා තිබුණි. තව ද, ගෘහස්ත සහල් සැකසීමේ ව්‍යාපෘතීන් ද සාර්ථක තත්ත්වයේ පැවතුණි. ඒ අනුව, ගෘහස්ථ මට්ටමෙන් ඉහළ විභවයක් ඇති කිරි නිෂ්පාදන ව්‍යාපෘතීන් ප්‍රවර්ධනය කිරීම, සුරතල් මත්ස්‍ය ව්‍යාපෘති, කුඩා පරිමාණ සහල් සැකසීමේ ව්‍යාපෘති, බිත්තර සඳහා කුකුල් පාලනය වැනි සාර්ථක ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම සමස්ථ ඉදිරි ව්‍යාපෘතීන් හි තිරසාරභාවය සඳහා බෙහෙවින් ඉවහල් වනු ඇතැයි යෝජනා කළ හැකි ය. එසේ ම, අදාළ ව්‍යාපෘතීන් නිරන්තර ඇගයීමට ලක්වීම සිදුවිය යුතු අතර එය ව්‍යාපෘතීන් සාර්ථක වීමට සෘජුවම බලපානු ඇත. ඊට හේතු වන්නේ ව්‍යාපෘති සාර්ථක වීම තුළ මුදල් ආපසු ගෙවීමේ සාධකය තීරණය වන නිසා ය. එය චක්‍රීය අරමුදලක් තුළින් සිදුවන ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට ප්‍රධාන වශයෙන් සාධකයක් ද විය හැකි ය.